// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2208/11 – 2020 දෙසැම්බර් 28 වැනි සඳුදා – 2020.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2018/229.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2020.07.09 වැනි දින අංක 2183/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.03.11 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජේ. ඩබ්. කේ. බණ්ඩාර මයා, අංක 175/එෆ් 6, ඇල්විටිගල මාවත, කොළඹ 08.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

බොගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී, අංක 153, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර පවත්නා 2020.01.13 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. මහාදේව මයා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2020.03.11 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

1A – G 33380 – 25 (2020/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2018/229.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජේ. ඩබ්. කේ. බණ්ඩාර මයා, අංක 175/එෆ් 6, ඇල්විටිගල මාවත, කොළඹ 08.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

බොගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී, අංක 153, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල බණ්ඩාරනායක මාවත, අංක 5ඒ, නීතිඥ සුජීව ජයසිංහ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/229.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. ඩබ්. කේ. බණ්ඩාර මයා, අංක 175/එෆ් 6, ඇල්විටිගල මාවත, කොළඹ 08.

සහ

බොගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී, අංක 153, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''බොගවන්තලාව ටී එස්ටේට් පීඑල්සී ආයතනයේ සේවය කර ඇති ජේ. ඩබ්. කේ. බණ්ඩාර මහතාට වාර්ෂික විවේක දීමනාව (Annual Vacational Allowance) නොගෙවීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 49

මගේ අංකය: IR/COM/01/2016/151.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2020.07.08 වැනි දින අංක 2183/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.03.13 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.

2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.

3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.

4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.

5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර පවත්නා 2020.01.18 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩී. එම්. කරුණාරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2020.03.13 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.

2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.

3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.

4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.

5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මොරටුව, උයන, ඩබ්. ඒ. පීරිස් මාවත, අංක 4/82, ජනාධිපති නීතිඥ සුහද කල්‍යාණ ගම්ලත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.

2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.

3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.

4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.

5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''ඉහත නම් සඳහන් සේවකයින් පස්දෙනා හට විධායක II ශ්‍රේණියේ කළමනාකරු (මුදල්) තනතුරෙහි සිට විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) තනතුර දක්වා උසස්වීමේ අවස්ථාව අහිමි කිරීම මගින් එකී සේවකයන්ට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවා ද'' යන්න පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 50

---

මගේ අංකය: IR/COM/04/E/2014/159.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2016.01.25 වැනි දින අංක 1951/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.01.19 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

එක්සත් වෙළඳ සේවා සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02. (බන්දුල රාජමුණි මහතා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

රාජ්‍ය ද්‍රව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අතර පවත්නා 2015.12.18 දින දරන කම්කරු කොමසාරිස්ගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2016.01.19 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/E/2014/159.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

එක්සත් වෙළඳ සේවා සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02. (බන්දුල රාජමුණි මහතා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, මිහිඳුපුර, දම්මෝදය මාවත, අංක 13/1127, සරත් චන්ද්‍රසිරි විතාන මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/E/2014/159.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක්සත් වෙළඳ සේවා සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02. (බන්දුල රාජමුණි මහතා වෙනුවෙන්)

සහ

රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

රාජ්‍ය දැව සංස්ථාවේ කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ විගණන පරීක්ෂක නිලධාරියෙකු ලෙස සේවය කරන බන්දුල රාජමුණි මහතාට,

1. වෘත්තීය සමිති කටයුතුවල නිරතවීම සඳහා ලබා දී තිබූ සතියේ එක් දිනක රාජකාරී නිවාඩුව අවලංගු කර ඒ වෙනුවෙන් 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ ලබාගත් නිවාඩු ඔහුට හිමි වාර්ෂික නිවාඩු වලින් අඩු කිරීමට සහ තවත් ඉතිරියක් වේ නම් එම නිවාඩු වැටුප් රහිත නිවාඩු සේ සලකා කටයුතු කිරීමට ගෙන ඇති තීරණය හේතුවෙන් අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා

2. 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ බන්දුල රාජමුණි මහතා ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වූ දිනයන් අතරින් ප්‍රමාද වී පැමිණි දිනයන් ලෙස සලකා ඔහුගේ වාර්ෂික නිවාඩු වලින් අඩු කිරීමට සහ තවත් ඉතිරියක් වේ නම් එම නිවාඩු වැටුප් රහිත නිවාඩු සේ සලකා කටයුතු කිරීමට ගෙන ඇති තීරණය හේතුවෙන් අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා

3. 2014 වර්ෂයේ සහ 2015 වර්ෂයේ වැටුප් වර්ධක අත්හිටුවීම සහ 2014 වර්ෂයේ ප්‍රසාද දීමනා අහිමි කිරීම හේතුවෙන් අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා

එලෙස අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවා ද යන්න පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 51

---

මගේ අංකය: IR/COM/03/2017/193.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2020.03.10 වැනි දින අංක 2166/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.02.24 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

එම්. ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර පවත්නා 2019.12.17 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩී. එම්. කරුණාරත්න මයා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2020.02.24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/193.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

එම්. ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිචඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 4, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/193.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එම. ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ V ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) වරයෙකු වශයෙන් සේවය කරන එම්. ජේ. චන්ද්‍රතිලක මහතාට අදාළ ශ්‍රේණියට හිමි වැටුප් තලය ලබා නොදීම යුක්ති සහගත ද යන්නත් එසේ යුක්ති සහගත නොවන්නේනම් ලබා දිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 52

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.